# මානුෂිකත්වයට එරෙහිව සිදුකර ඇති සාපරාධි ක්‍රියා

## දෙවන කොටස



> " මිනිසුන් අසම්මතයන් කෙරෙහි විශ්වාසය තබන තාක්කල් අමානුෂික ක්‍රියාවන්හි අඛණ්ඩවම නිරත වනු ඇත. "
>
> වෝල්ටෙයර්

වෛද්‍ය රුවන් එම්. ජයතුංග

### ඇල්ජීරියාවේ හා ඉන්දු චීනයේ * ප්‍රංශ ජාතිකයන් සිදුකරන ලද අපරාධ

ප්‍රංශ ජාතිකයන් විසින් වසර 132 ක් පුරා ඇල්ජීරියාව අත්පත් කරගෙන සිටි අතර දරුණුතම ම්ලේච්ඡ ක්‍රියාවන් සිදුකරන ලද්දේ 1830 * 1862 අතර කාල වකවානුවේදීය. 1870 දී ඇල්ජීරියාවේ ආණ්ඩුකාර තෝමස් බියොනාඩ් විසින් ඇල්ජීරියානු සිවිල් වැසියන් හට පහර දීමට පටන් ගත්තේ ඔවුන් සමූල ඝාතනය කරමින් හා රටින් පිටුවහල් කරමිනි. සමහර වාර්තා වලට අනුව සිය ගණන් මිනිසුන් පණ පිටින් පුලුස්සා දමන ලද හෝ ආක්‍රමණික ප්‍රංශ හමුදා වලින් සැඟවීම සඳහා සැඟව සිටි පුද්ගලයන් එම ගුහාතුලදීම නිෂ්පූර්ණ මරණ වලට (ඔක්සිජන් නොමැති වීමෙන් සිදුවන මරණ) ගොදුරු කරන ලදහ. ගම්මානවල සිවිල් වැසියන් මරා දමමින්, කාන්තාවන් දූෂණය කරමින්, ගම්මාන වලට ගිනි ලබන ලදී. ගම් වැසියන් කුස ගින්නෙන් මිය යෑමට ඉඩ හැර, දේපළ, ආහාර හා අස්වැන්න විනාශ කොට දමන ලදී. ප්‍රංශය විසින් ඇල්ජීරියාව අත්පත් කරගෙන සිටි කාලය තුලදී ඇල්ජීරියානු ජාතිකයන් විශාල පිරිසක් දේශපාලන කඳවුරුවලට හෝ ලකුඩාරම් නගරවලටල බලෙන් යවන ලදී. 1830*1930 අතර කාල වකවානුව තුළදී ඇල්ජීරියානු ජනගහනයෙ-න් 15% හා 25% අතර සංඛ්‍යාවක් එබඳු කඳවුරු තුළදී මිය යන ලද බවට වාර්තා වේ.

දහස්ගණන් ඇල්ජීරියානුවන්ට එරෙහිව ප්‍රංශ යුද හමුදාව හා පොලීසිය විසින් පුළුල් අන්දමින් සිදු කළ ශාරීරික වදහිංසා පැමිණවීම් පිළිබඳව 1957 වසරේදී අන්තර්ජාතික රතුකුරුසය මගින් ලොවට හෙළි කරන ලදී. ප්‍රංශ ජාතිකයින් විසින් කායික වධහිංසා පැමිණවීම් කිරීමට යොදාගත් තාරැණයන් අතර සිරුරේ ඉතාම සංවේදී ඉන්ද්‍රියන්ට විදුලි සැර යෙදීම, ජලයේ ගිල්වීම, වීදුරු හා ලී වස්තූන් සමඟ මෛථූනයේ යෙදවීම, පාද වලින් හා දෑත්වලින් එල්ලා තැබීම හා සිගරට්ටු වලින් පිළිස්සීම ආදිය විය. (මරන්, රීටා (1989) මේ අතරින් වඩාත්ම ප්‍රකෝපකාරී ක්‍රියාව වූයේ 1945 මැයි මාසයේදී අල්ලාගත් ප්‍රංශ හමුදා විසින් ඉතාම සුළු දින කිහිපයක් තුළදී ඇල්ජීරියානුවන් 45,000 ක් පමණ සංහාරයට ලක් කළ ක්‍රියාවයි.

### ජපාන අධිරාජ්‍යවාදයේ බියකරු පාර්ශවය

ජපාන අධිරාජ්‍යවාදී යුගයේදී ඔවුන් විසින් අල්ලා ගන්නා ලද ආසියාතික රටවල විශාල වශයෙන් ම්ලේච්ඡ ක්‍රියාවන් කරන ලදී. ජපාන අධිරාජ්‍යවාදී හමුදා මගින් සතුරු සිවිල් වැසියන් හා සතුරු සටන් වදින්නන්ට එරෙහිව අපරාධ සිදුකරන ලදී. ඉමහත් අපකීර්තියට පත් 1937 නැන්කින් මිනිස් සංහාරයේදී දස දහස් ගණන් චීන සිවිල් වැසියන් ඝාතනය කළ අතර 20,000*80,000 අතර සංඛ්‍යාවක කාන්තාවන් ජපාන යුද සෙබළුන් විසින් දුෂණයට බඳුන් කරන ලදී. අධිරාජ්‍යවාදී යුධ හමුදාව විසින් සුවපහසුව සලසන්නන් හෝ ලිංගික වහලුන් වශයෙන් සේවය කරනු පිණිස චීනයෙන් හා කොරියාවෙන් කාන්තාවන් බලයෙන් පැහැරගෙන යන ලදී. දෙවන ලෝක යුද සමයේදී ඇස්තමේන්තු ගත පරිදි 100,000 සිට 400,000 දක්වා කාන්තා ලිංගික වහලුන් සංඛ්‍යාවක් ජපාන යුද හමුදා හටයින්ට ලිංගික සේවය සලසනු පිණිස බලෙන්ම යොදවා ගන්නා ලදී.

1937*1945 අතර කාලයේදී 3,000,000 සිට 10,000,000 දක්වා ජනතාවක් බොහෝවිට 6,000,000 ක් චීන ඉන්දුනීසියානු, කොරියානු, පිලිපීන හා ඉන්දු චීන ජාතිකයන්, ජපාන යුද හමුදාව විසින් මරා දමන ලදී.මරණයට පත්කරන ලද අනෙකුත් අය අතර අපරදිග යුද සිරකරුවෝද වූහ. (මහාචාර්ය ඍ.ජ. එමපපැක* දේශපාලන විද්‍යාපීඨය * හවායි විශ්ව විද්‍යාලය)

### ඕස්ට්‍රේලියාවේ අඳුරු අතීතය

ඕස්ට්‍රෑලියාවේ නව ජනපද පිහිටවූ යුරෝපීයයන් හට එහි දේශීය ජනතාවගෙන් එතරම් විරෝධතාවන්ට මුහුණදීමට සිදු නොවීය. සමහර ආහාර හිඟවූ අවස්ථාවලදී ආහාර සැපයීමෙන් පවා නව පදිංචිකරුවන්ට උපකාර කිරීමට ඇබරජිනියන්-වරුන් ඉදිරිපත් විය. ඇබරජිනියන්වරුන් කිසිසේත්ම හොඳින් සන්නද්ධ වූ යුරෝපීය පදිංචික-රුවන්ට සමකළ නොහැකි විය. ක්‍රමයෙන් මෙම ස්වදේශිකයින්ට පහර දී කාන්තාර ප්‍රදේශවලට පළවා හරින ලදී. අපකීර්තියට පත්ව ඇති 1830 දී සිදු වූ එහ්කක ක්‍රැඑ සමූහ ඝාතනයේදී ඇබරිජියානු ළමුන් පවා මරා දමන ලදී.

1869 සිට 1960 අතර කාලය තුළදී (සමහර ප්‍රදේශවල 1970 තෙක්) ඕස්ට්‍රෑලියානු රජය විසින් අර්ධ ඇබරිජියානු ළමුන්, ඔවුන්ගේ මවුවරුන්, දෙමාපියන් පවුල් හා ප්‍රජාවන් බලෙන් පිටමං කරන ලදී. ළමුන් සමහර ආයතනවලට ද යවන ලදී. 1950 සිට සමහර ළමුන් සුදු ජාතික පවුල් සමඟ ද රඳවා තබන ලදී. ඇබරජිනියන් ළමුන් කම්කරුවන් හෝ සේවකයින් විය යුතු බවට බලාපොරොත්තු වන ලදී. විශේෂයෙන් ඇබරජිනියන් දැරියන් ගෘහ සේ-වයට පුහුණු කිරීම පිණිස මණ්ඩලය මගින් ස්ථාපිත කරන ලද නිවෙස් වලට පිටත් කරන ලදී. මෙම පීඩාවට පත්වූවන් පසුකලෙක ලසොරාගන්නා ලද පරම්පරාවක්ල ලෙසින් හඳුන්වනු ලැබීය. මෙල්බර්න් විශ්ව විද්‍යාලයේ මනෝචිකිත්සක හා වෛද්‍ය ජේන් මෙකන්ඩ්‍රික් ප්‍රකාශ කොට ඇත්තේ ලසොරා ගන්නා ලද පරම්පරාවේ පුද්ගලයින් බෝහෝදෙනෙකු මානසිකව, කායිකව හෝ ලිංගිකව අපචාරයට පත්වූ අයයි,ල යනුවෙනි.

### දෙවන ලෝක යුද සමයේදී ජර්මන් හමුදා විසින් සිදුකරන ලද ම්ලේච්ඡ ක්‍රියාවන්

හිට්ලර්ගේ පාලන සමයේදී හ්ෂ ජර්මනිය විසින් දේශපාලන සිරකඳවුරුවල සිටි යුදෙව්වන් මිලියන 6ක් පමණ සමූල ඝාතනය කරන ලදී. අල්ලා ගත් ප්‍රදේශවල ජර්මානු හමුදා විසින් බරපතල අපරාධ සිදුකරන ලදී. යුදෙව්වන්, පෝලන්ත ජාතිකයින්, රුසියානුන් අභිකුන්ටික ගෝත්‍රිකයන් හට කායික වධහිංසා පැමිණවීම, පිටුවහල් කිරීම, මර,ය දණ්ඩනය දීම ආදී බොහෝ කෲර ක්‍රියාවන් සිදු කරන ලදී. 1939*1945 අතර කාලයේදී තමන් අල්ලා ගත් ප්‍රදේශ වල සහයෝගී රාජ්‍යයන් හා අල්ලාගත් රාජ්‍යවලින් හමුදාවට බඳවාගන්නා ලද පිරිසකගේ ද සහාය ලබා සිටි ජර්මන් හමුදාව විසින් මිලියන 11*14 දක්වා සංඛ්‍යාවක් සංවිධානාත්මකව මරු-මුවට පත්කරනු ලැබීය. බොහෝ අහිංසක මිනිසුන් කුසගින්නේ මියයාමට ඉඩහැර තබන ලදී. ඎදකදප්මීඑ (අග්නිහෝමය) මානව ඉතිහාසයේ කලු පැල්ලමක් ලෙසින් අදට ද සටහන්ව පවතී.

### පලස්තීනයට විරුද්ධව ඊශ්‍රායල් ප්‍රචණ්ඩත්වය

පලස්තීන සිවිල් වැසියන්ට එරෙහිව සංවිධානාත්මකව පහරදීම් දියත්කිරීම සම්බන්ධයෙන් එක්සත් ජාතීන් විසින් (ඔහ )* ඊශ්‍රාලය ගර්හාවට ලක්කරන ලදී. සිවිල් වැසියන් ඝාතනය කරමින්, දහස් ගණන් නිවාස විනාශ කරමින්, මෑතකදී ගාසා තීරයේ කල පහරදීම්, ඊශ්‍රායල හමුදාව විසින් සිදුකරන ලද භයානක ම්ලේච්ඡ ක්‍රියාවන් හැටියට විස්තර කළ හැකි වේ. පලස්තීනයේ මානව හිමිකම් මධ්‍යස්ථානයට අනුව ඊශ්‍රායල ප්‍රහාරවලදී පලස්තීනුවන්, 1434 දෙනෙකු මරණයට පත්විය. ඔවුන්ගෙන් 960 දෙනෙකු සිවිල් වැසියෝ වූහ. ඒ අතර ළමුන් 288 ක් විය. ගාසා තීරයේ ඊශ්‍රායල් ක්‍රියාකාරකම් මානුෂවාදී බවට මෙන්ම මානව ගරුත්වයට අදාළව ද අර්බුද නිර්මාණය කළේය. මිනිසුන්ගේ ජීවනෝපායට අදාළ මෙම දැවැන්ත විනාශකාරී ක්‍රියාවන් හා යටිතල පහසුකම් පරිහාණියට පත්වීමෙන් අනතුරුව ගාසා තීරයේ ජනගහනයෙන් 80% ක් මේ වන විට වාසය කරන්නේ මානුෂීය ආධාර යටතේය.

### මානුෂිකත්වයට එරෙහිව සිදුකර ඇති සාපරාධි ක්‍රියා නිම කිරීම

ජාත්‍යන්තර අපරාධ අධිකරණයට අදාළ ආඥාපනත මගින් පැහැදිලි කෙරෙන ප්‍රකාශයේ නිර්වචනය වී ඇති පරිදි මානුෂිකත්වයට එරෙහිව සිදු වන අපරාධ යනු විශේෂයෙන් ද්වේෂසහගත, නීති විරෝධී ක්‍රියාවන්ය. එම ක්‍රියාවන් තුළ මානව ගරුත්වයට අදාළ බරපතල පහරදීම් හෝ එක් මිනිසෙකු හෝ මිනිසුන් කිහිපදෙනෙකුට සිදු කරනු ලබන බරපතල අපහාස කිරීම් හෝ පහත්කොට සැළකීමේ ක්‍රියාවන් අන්තර්ගත වී පවතී. ඒවා හුදකලා වූ විසිරි, පවතින සිද්ධීන් නොවේ, එක්කෝ රාජ්‍ය ප්‍රතිපත්තියක කොටසක් හෝ (එම අපරාධකරුවන් එම ප්‍රතිපත්තිය මත තමන් හඳුන්වා නොදෙතත්) රාජ්‍ය හෝ නිශ්චිත අධිකාරියක් මගින් ඉවසා සිටින හෝ ගැරහුම් කරනු ලබන ක්‍රියාවන් වේ. ඝාතනයට ලක්කිරීම්, මිනිස් සංහාරයන්, කායික වධහිංසා වලට ලක්ක-රීම, ස්ත්‍රී දූෂණය සහ දේශපාලනික හෝ වර්ගවාදී හෝ ආගමික හිංසනය හා අනෙකුත් අමානුෂික ක්‍රියාවන් මානුෂවාදී බවට විරුද්ධ අපරාධවල එළිපත්ත කරා ලඟා වීමට උපකාරී වේ. එසේ වන්නේ ඒවා ව්‍යාප්තවූ හෝ විධිමත් ආකාරයකින් කරන ලද ක්‍රියාමාර්ගයක් නම් පමණකි.

මේ ආකාරයෙන් හුදකලා වූ අමානුෂික ක්‍රියාවන් මගින් මානව හිමිකම්වල දැඩි උල්ලංඝණය වීම් හෝ අදාළ අවස්ථාව අනුව යුධ අපරාධ ලෙස සැළකේ. එතෙක් සමහර අවස්ථාවල කලින් සාකච්ඡා වූ අපරාධ යටතට නොවැටීම සිදුවනු ඇත.

ලමානුෂවාදී බවට විරුද්ධ අපරාධ පිළිබඳ සෙවීමට මුල් පිරීම * ජාත්‍යන්තර අර්බුධ කණ්ඩායමල, යන්නෙහි සභාපති වන ගැරත් එවන්-ස් ඔහුගේ අදහස් ප්‍රකාශ කරන්නේ පහත දැක්වෙන ආකාරයටය.

ලජාත්‍යන්තර සබඳතා හා බලන කල්හි විශේෂයෙන්ම යුද්ධය හා සාමයට අදාළ ගැටලු ප්‍රචණ්ඩත්වය සහ අප විසින් මෙහිදී සැළකිල්ලට බඳුන් කළ අතිශය දරුණු ලෙස සළකන මානව හිමිකම් කඩකිරීම් සම්බන්ධයෙන් ගත් විට සාමාන්‍යයෙන් ශුභවාදී මනසකින් මෙබඳු ක්‍රියාවන් කෙරේ යොමුවන ඕනෑම පුද්ගලයෙකු එක්කෝ මුළුමනින් උමතු නොවේ නම් අසාධනීය ලෙස මුග්ධ විය යුතුවේ. යම් රජයකින් තමාගේම වැසියනට එරෙහිව සෘජුවම සිදුකල හෝ එබඳු ක්‍රියාවන් වැළැක්වීමට අසමත් හෝ අකමැති රජයන් මගින් එසේ කිරීමට ඉඩහල, සමූහ ඝාතන සහ ම්ලේච්ඡත්වයට අදාළ අපරාධ ගත්විට නම්, මුළුමනින්ම උමතු කෙනෙකුට වුවද ශුභවාදීව මෙදෙස බැලිය නොහැකිය. අප ජීවත්වන මේ ලෝකය තුළ නරුම බව, දෙබිඩි පිළිවෙත්, ජාතික වටිනාකම්වලට දැඩිසේ විරුද්ධ වීම, ඉහළ පෙළේ දේශපාලනික ක්‍රියාකාරකම් හා දේශපාලනික වාසි තකා පහත් මට්ටමේ ක්‍රියා කිරීම ආදී ක්‍රියාකාරකම් බහුලව පවතී.

### කුරිරු ජාතීන් ලොව නොමැත

සෑම ජාතියක්ම එකිනෙකාට එරෙහිව කිසියම් ආකාරයක ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුකොට ඇත. පුළුල් අරුතකින් ගත්කල සියලුදෙනාම ආක්‍රමණිකයින් මෙන්ම පීඩාවට පත් වන්නන් ද වූහ. අප සිතන ආකාරයේ කෲර ජාතීන් ලෝකයේ නැත. ජනතාව ප්‍රචණ්ඩ ක්‍රියාවන් කිරීමට පොළඹවිය හැක්කේ අගතියට පත් පුද්ගලයින් හටය. එබඳු අඳුරු බලපෑම් කෙරේ ජනතාව සංවේදීව හා අවධියෙන් සිටිය යුතුවේ.

ක්‍රිෂ්ණමූර්ති නම් ඉන්දීය ජාතික දාර්ශනිකයාගේ ප්‍රකාශයකින් ප්‍රචණ්ඩත්වයේ හා අගනිසේ බීජ මිනිස් මනස තුළ මුල්බැස ගන්නා අන්දම පිළිබඳව වඩාත් පුළුල් අවබෝධයක් ලබාදේ. In Freedom from the known ග්‍රන්ථය - පිටු 51-52

ලඔබ, ඔබව ඉන්දියානුවෙකු, මුස්ලිම්වරයෙකු, ක්‍රිස්තියානිකාරයෙකු, යුරෝපීය ජාතිකයෙකු හෝ වෙනත් ඕනෑම කෙනෙකු බවට පවසන්නේ නම් ඔබ ප්‍රචණ්ඩය. එය ප්‍රචණ්ඩ වන්නේ මන්දැයි ඔබට පෙනෙන්නෙහිද? අනෙකුත් මිනිස් පිරිස අතුරෙන් ඔබ, ඔබව වෙන් කරයි. ඇදහිලි, ජාතිය හෝ සම්ප්‍රදායන් මත ඔබ වෙන් වෙන විට එය ප්‍රචණ්ඩත්වය කරා මග පාදයි. එබැවින් ප්‍රචණ්ඩත්වය යන්න වටහාගැනීමට තැත් කරන මිනසෙකු කිසිඳු රටකට, කිසිඳු ආගමකට, කිසිඳු දේශපාලන පක්ෂයකට හෝ පක්ෂග්‍රාහී ක්‍රමයකට අයත්නොවේ. ඔහු සැළකිල්ල දක්වනුයේ මිනිසත්බව යන්න මුළුමනින් වටහාගැනීමටය. ල

### ම්ලේච්ඡ ක්‍රියාවන් හා මිනිස් සංහාර පිළිබඳව මයිකල් ආතර් නිව්ඩව්ගේ ද ගේ මතය

මිනිසුන් එක්දිනෙක සැනින් අවදිව සාමූහික සංහාර නොකරයි. ඔවුන් එය ආරම්භ කරනුයේ ක්‍රම ක්‍රමයෙනි. අන් අයගෙන් සෙමින් ඉවත් වී, යම් විශ්වාසයන්හි ගැලී සිටින අයව එම විශ්වාසයන් හීන කරවීමට තුඩුදෙන අන්දමට ක්‍රියාකරමින් සුළු වංචනික පියවර තබමින් එය ආරම්භ කරයි. ඔවුන් එයට ඉදිරිපත් වනුයේ ද ලඅපි ධාර්මික වෙමු. අපි අන් අයගේ මත ඉවසමු.ල යනුවෙන් පවසමිනි. මෙම ඉවසීම කාලය සමඟ හීන වී යත්ම නොවැළැක්විය හැකි හානි සම්බන්ධව සැළකිල්ලට නොගනී යයි. ඬඅපගේ නිදහසට අදාළ ප්‍රථම පියවරේදීම අනතුරු සංඥාවක් ඇතිකරගැනීම සුදුසුය.ඬ යනුවෙන් ෙ-මිස් මැඩිසන් ප්‍රඥාවෙන් යුතුව පවසා ඇත්තේ එබැවිනි.

*වෛද්‍ය රුවන් එම්. ජයතුංග විසින් ලියන ලද The Atrocities Committed Against Humanity ලිපිය ඇසුරෙනි. පරිවර්තනය A S වික්‍රමසිංහ*